# මිල ගණන් කැඳවීමයි

## භාවිතයෙන් ඉවත් කරන ලද පුවත්පත් අපහරණය
## කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

1. කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ භාවිතයෙන් ඉවත් කරනු ලබන පුවත්පත් විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

2. මිල ගණන් ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය "ගොවිජන මන්දිරය", අංක 80/ 5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ලෙහි කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ පළමු මහලෙහි පිහිටි පාලන හා ප්‍රසම්පාදන අංශය වෙතින් 2025. 10. 21 දින සිට 2025. 11. 09 දින දක්වා වන කාර්යාලීය දිනයන්හි දී පෙ.ව. 9. 00 සිට ප. ව. 4. 00 දක්වා **නොමිලේ** ලබා ගත හැකි ය. නැතහොත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.agrimin.gov.lk වෙත පිවිස ප්‍රසම්පාදන දැන්වීම් හරහා බාගත කිරීමට ද හැකියාව ඇත.

3. 2025. 11. 10 දින ප.ව 2.00 දක්වා මිල ගණන් භාර ගන්නා අතර 2025. 11. 10 වන දින ප.ව 2.00ට පළමු මහලෙහි පිහිටි පාලන හා ප්‍රසම්පාදන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් කාර්යාලයේදී එම මිල ගණන් විවෘත කරනු ලැබේ.

4. අදාළ පුවත්පත් තොගය කෘෂිකර්ම , පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පැමිණ පරීක්ෂාකර බැලිය හැකි අතර මිල ගණන් ඉදිරිපත් කරන්නන් සම්පූර්ණ පුවත්පත් තොගයම මිලදී ගැනීම සිදු කළ යුතු අතර මිල ගණන් එක් කිලෝග්‍රෑමයක් සඳහා ඉදිරිපත් කළ යුතු ය.

5. මිල ගණන් ඉදිරිපත් කරන්නන් හට මෙම මිල ගණන් විවෘත කරන අවස්ථාවට සහභාගීවීමට හැකිය.

6. සාර්ථක මිල ගණන් ඉදිරිපත් කළ ගැනුම්කරුවා වෙත ලිඛිතව දැනුම් දෙන අතර එකී ලිපියේ සඳහන් දින සිට වැඩ කරන දින හතක් ඇතුළත, අදාල නිලධාරි කමිටුවක් ඉදිරිපිට දී පුවත්පත් තොගය කිරා ගැනීමෙන් අනතුරුව ඊට අදාල සම්පූර්ණ මුදලම අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවීමෙන් අනතුරුව දින තුනක් තුළ පුවත්පත් තොගයම අමාත්‍යාංශ පරිශ්‍රයෙන් නියමිත පරිදි ඉවත් කර ගත යුතු ය.

7. මිලදී ගැනීමෙන් පසු එසේ ඉවත් කර නොගන්නා පුවත්පත් තොගය සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වගකියනු නොලබන බව ද දන්වමි.

8. මෙම මිල ගණන් කැඳවීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

9. මේ පිළිබඳ දුරකථන 011-2887406 අංකය මෙම අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය ඇමතීමෙන් වැඩි විස්තර ලබා ගත හැක.

ඩී.පී.වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

දිනය : 2025.10.17

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.